
# ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය 1979 වසරේ සිට ක්‍රීඩා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාඨමාලා පවත්වනු ලබන ප්‍රමුඛ ආයතනය වේ.**







# ක්‍රීඩා අධ්‍යාපන පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම - 2022

## පුහුණුකරු උසස් පාඨමාලාව - ශක්තිය හා යෝග්‍යතා පුහුණුව (NVQ 6)

ක්‍රීඩා ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා නව තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වේ. වෘත්තීයමය ක්‍රීඩා පුහුණුකරුවකු ලෙස ජාත්‍යන්තරය ජයගැනීමට අවශ්‍ය ගවේෂණාත්මක දැනුම ලබාදීම මෙම පාඨමාලාව මගින් අපේක්ෂා කෙරේ.

**පාඨමාලා කාලය** : මාස 12 (මාස 6ක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලා කාලයක් සහ මාස 6ක පර්යේෂණ කාලයක් අන්තර්ගත වන අතර සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 45,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන ක්‍රීඩා ඩිප්ලෝමාව සමත් වීම සහ අවම වශයෙන් ජාතික මහා ක්‍රීඩා උලෙලේ පළාත්, ජාතික පාසල් තරඟ වල ජයග්‍රහණය කළ ඉසව්වක පුහුණුකරුවෙකු වීම.

හෝ

2. වසර 03ක (අධ්‍යාපන විද්‍යා පීඨ) ශාරීරික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම සහ අවම වශයෙන් ජාතික මහා ක්‍රීඩා උළලේ පළාත්, ජාතික පාසල් තරඟ වල ජයග්‍රහණය කළ ඉසව්වක පුහුණුකරුවෙකු වීම.

## ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5)

ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයේ රැකියා කරන, රැකියාවක් අපේක්ෂා කරන පුද්ගලයින් සඳහා විද්‍යාත්මක ක්‍රීඩා පුහුණුකරණය පිළිබඳ 1973 අංක 25 දරණ ජාතික ක්‍රීඩා පනත මගින් සථාපිත කර ඇති එකම ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. විවිධ ක්‍රීඩා ඉසව් පිළිබඳව සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික දැනුම අභ්‍යාසලාභීන් වෙත ලබාදීම මෙම පාඨමාලාවේ අරමුණ වේ.

**පාඨමාලාව හැදෑරීම තුළින් දේශීය හා විදේශීය වශයෙන් පිළිගත් NVQ 05 මට්ටමේ සහතිකයක් හිමිවේ.**

**පාඨමාලා කාලය** : මාස 12 (පූර්ණ කාලීන පාඨමාලාවකි)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 60,000.00

**පාඨමාලාව සඳහා බඳවාගනු ලබන වයස් සීමාව :**

අවුරුදු 18 - 35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45ට නොවැඩි විය යුතුය)

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේදී සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සම්මාන 03ක් සහිතව සමත් වීම.

සහ

2. පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසැලක යටත් පිරිසෙයින් මාස 06 පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

හෝ

3. ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක හෝ ශාරීරික පුහුණු උපදේශකවරයෙකු / වරියක වශයෙන් මාස 06කට නොඅඩු මූලික සහ උසස් පාඨමාලාවක් සාර්ථකව හදාරා සමත්ව තිබීම.

හෝ

4. පාසැල් ක්‍රීඩා ගුරුවරයකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙයින් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම.

හෝ

5. කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයකු වියයුතු අතර කිසියම් ජාත්‍යන්තර තරඟයකට සහභාගී වී තිබීම.

හෝ

6. ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළලේ දී දිස්ත්‍රික්ක මට්ටමේ තරඟයකදී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම. එසේ නැතහොත් ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරඟයකදී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතුය.

**සැ.යු.** : රජයේ, පළාත් සභා හා ආයතනයන්, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාල දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## ස්වායු ව්‍යායාම උපදේශක පුහුණු පාඨමාලාව

(Aerobics Instructor Training Course - 2022)

මෙම පාඨමාලාව තුලින් වෘත්තීය මට්ටමේ ස්වායු ව්‍යායාම උපදේශකවරයෙක් වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය දැනුම ලබාදෙන අතර මෙමගින් ශාරීරික යෝග්‍යතාවය හා විනෝදාස්වාදය සඳහා ව්‍යායාම කිරීම මෙන්ම, වර්තමානයේ බහුලව දක්නට ලැබෙන බෝනොවන රෝග පාලනය කිරීම සඳහා ව්‍යායාම වැඩසටහන් සකස් කිරීමට ද අවශ්‍ය කුසලතාවයන් ලබා දේ.

**පාඨමාලා කාලය** : පැය 100 ( ඉරිදා / සඳුදා )

**පාඨමාලා ගාස්තු** : රු. 20,000.00

**පාඨමාලා මාධ්‍යය** : සිංහල

**බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.සා. පෙළ විභාගය සමත්වීම සහ ක්‍රීඩා පසුබිමක් තිබීම.

## ක්‍රීඩා ආබාධ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ක්‍රීඩකයින් ක්‍රීඩා ආබාධ වලින් වළක්වා ගැනීම සහ ක්‍රීඩා ආබාධ කළමනාකරණය පිළිබඳ මූලික දැනුම ලබාදීමේ අරමුණින් ක්‍රීඩා පුහුණුකරුවන් හා ශාරීරික යෝග්‍යතා උපදේශකවරුන් ඉලක්ක කර ගනිමින් මෙම පාඨමාලාව පවත්වනු ලබයි.

**පාඨමාලා කාලය** : පැය 100 (සතියේ දින දෙකකදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 17,250.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

ක්‍රීඩා පුහුණුකරුවෙක් හෝ ශාරීරික යෝග්‍යතා උපදේශකවරයෙක් ලෙස සේවා පළපුරුද්දක් තිබීම.

## ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I

වෘත්තීයමය ක්‍රීඩා පුහුණුකරුවකු ලෙස සාර්ථකත්වය වෙත ලඟාවීමට අපේක්ෂා කරන පුහුණුකරුවන්ට (ආයතනගත හා ස්වේච්ඡා පුහුණුකරුවන්) ක්‍රීඩාවට අදාල නූතන තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වෙන අතර **කබඩි, මල්ලවපොර සහ ටයිකොන්ඩෝ** යන ක්‍රීඩාවන්ට අදාල පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලබයි.

**පාඨමාලා කාලය** : සති 06 (පැය 60කි. - සතියට දින 02 බැගින් පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 7,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. විවෘත මට්ටමේ නම්, දිස්ත්‍රික් ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම්, ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වීම හෝ එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම,

හෝ

2. පාසල් මට්ටමේ නම්, කලාප ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම් ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වීම හෝ එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම,

හෝ

3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

## ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර II

ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා නිවැරදි නූතන තාක්ෂණික දැනුම වැඩිදුරටත් ලබාදීමේ ඉදිරි පියවරක් ලෙස ජූඩෝ, බැඩ්මින්ටන් සහ වොලිබෝල් යන ක්‍රීඩාවන්ට අදාල පාඨමාලාවන් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලා කාලය** : සති 12 (පැය 120 - සතියට දින 02 බැගින් පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 10,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I **(ජූඩෝ, බැඩ්මින්ටන් සහ වොලිබෝල්)** සමත්ව තිබීම,

හෝ

2. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

සහ

3. ජාතික/පළාත්/දිස්ත්‍රික්ක මට්ටමේ ජයග්‍රහණ අත් කරගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම.

## පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව

ශ්‍රී ලංකාවේ පුහුණුකරුවන්ගේ ක්‍රීඩා දැනුම සහ කුසලතා සංවර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලාව පවත්වනු ලබන අතර මෙම වසරේදී **පැසිපන්දු සහ කරාතේ** යන ක්‍රීඩා සඳහා වන පාඨමාලාවන්ට අයදුම්පත් කැඳවනු ලැබේ.

**මෙම පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කරන පුහුණුකරුවන් ශ්‍රී ලංකාවේ අදාල ක්‍රීඩාවේ පුහුණුකිරීම් සඳහා සුදුසුකම්ලත් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස සළකනු ලබන අතර, එම පුහුණුකරුවන් මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර "පුහුණුකරු ලියාපදිංචි සහතිකය" නිකුත් කිරීමටද කටයුතු කෙරේ.**

**පාඨමාලා කාලය** : මාස 03 (සෙනසුරාදා හෝ ඉරිදා දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා ගාස්තු** : රු. 8,000.00

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. පුහුණුකරුවෙක් ලෙස වසර 03ක පළපුරුද්ද තිබීම.

හෝ

2. ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ අත්කරගත් ක්‍රීඩකයින් පුහුණුකර තිබීම.

**වැදගත්** : මෙම පාඨමාලාවන් සඳහා බඳවා ගැනීමේදී ඉල්ලුම් කර ඇති සුදුසුකම් වලට අමතරව ඉදිරිපත් කරනු ලබන ඉහළ දක්ෂතා සහ ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සඳහා ප්‍රමුඛතාවක් හිමිවේ.

## අයදුම්පත් එවියයුතු ආකාරය

සියළුම පාඨමාලා සඳහා අයදුම්පත් **www.niss.gov.lk** වෙබ් අඩවියෙන් හෝ සතියේ දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 4.00** දක්වා ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වෙත පැමිණ ලබාගත හැක. **සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022 ජනවාරි මස 27 දිනට හෝ ඊට පෙර, අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, 100/7, නිදහස් මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සැයු** : අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන පාඨමාලාව / ක්‍රීඩාව සඳහන් කළ යුතුය.




අධ්‍යක්ෂ,

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය**

100/7, නිදහස් මාවත, කොළඹ 07.

දුරකථන : 011-2684921 ෆැක්ස් : 011-2667709 වෙබ් අඩවිය : www.niss.gov.lk